## ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය 2012

### 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම

#### 1.2.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

2003 නොවැම්බර් 12 දිනැති අංක 19 දරණ කළමනාකරණ සේවා චක්‍රලේඛය පරිදි අලාභ ලබන ආයතන ප්‍රසාද දීමනා ලෙස ගෙවිය යුත්තේ එක් අයෙකුට රු.1,000 ක් වුවද, මණ්ඩලය විසින් 2010, 2011 සහ 2012 වර්ෂ සඳහා ප්‍රසාද දීමනා ලෙස රු.94,000 ක් ගෙවීම වෙනුවට එකතුව රු.3,717,751 ක් ගෙවා තිබුණි.

#### 1.2.2 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2011 මැයි 01 උන සිට වාහන ණය ලබාදීමේදී අයකළ යුතු පොලිය සියයට 4.2 ක දක්වා අඩුකර තිබුණි.

### 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

සමාලෝචිත වර්ෂය තුළ මණ්ඩලයේ මෙහෙයුම් කටයුතුවලින් වූ බදුවලට පෙර මූල්‍ය ප්‍රතිඵලය රු.19,056,965 ක ඌණතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌණතාවය රු.27,251,414

ක් වුයෙන් සමාලෝචිත වර්ෂයේ මුල්‍ය ප්‍රතිඵලයේ රු.8,194,449 ක හෙවත් සියයට 30 ක වර්ධනයක් පෙන්නුම් කර තිබුණි.

ඉකුත් වර්ෂයට සාපේක්ෂව මණ්ඩලයේ හදුනා ගත් ප්‍රදාන සියයට 76 කින්ද පොලි ආදායම සියයට 1,234 කින්ද වැඩිවී තිබීම හා වෘත්තීය ගාස්තු සියයට 39 කින් අඩුවීම මෙම මුල්‍ය ප්‍රතිඵල වර්ධනයට බලපා තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය
---------------------------

3.1 කාර්ය සාධනය
-----------------

2012 වර්ෂයට අදාල වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පරිදි සමාලෝචිත වර්ෂයේදී ඉටු කල යුතුව තිබුණු කාර්යයන සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පැමිණිලි විමර්ශනය සඳහා අවශ්‍ය මාර්ගෝපදේශ සංග්‍රහය සකස් කර නොතිබුණි.

(ආ) රක්ෂණ පාලක විසින් 1987 දී නිකුත් කරන ලද රෙගුලාසි සංශෝධනය කර නොතිබුණි.

(ඇ) අලාභ ගලපන්නන් සහ රක්ෂණ නියෝජිතයින් ලියාපදිංචිය සඳහා නියාමන ආකෘතියක් සකස් කර නොතිබුණි.

(ඈ) වර්ෂය තුළ දේශිය පුහුණු කටයුතු සඳහා රු.811,321 ක වියදමක් මුල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණත්, එයින් රු.756,321 ක් එනම් සියයට 93 ක සුභසාධක කටයුතු සඳහා වැය කර තිබුණි. ඒ අනුව රක්ෂණ ක්ෂේත්‍රයේ පුහුණු කටයුතු සඳහා මණඩලයේ අවධානය යොමු කර නොතිබුණි.

(ඉ) අධීක්ෂණ අංශය සඳහා කළමනාකරණ තොරතුරු පද්ධතිය වෙනුවෙන් රු.මිලියන 2.5 ක ප්‍රතිපාදන සලසා තිබුණත් අදාල කාර්යය ඉටුකර නොතිබුණි.

3.2 කාර්ය මණ්ඩල පරිපාලනය
------------------------------

2012 දෙසැම්බර් 31 දින වන විට මණ්ඩලයේ විධායක තනතුරු 05 ක් පුරප්පාඩුව පැවතිණි. ඉන් විධායක තනතුරු 02 ක් වර්ෂය ආරම්භයේ සිට පුරප්පාඩුව පැවතුණි.

## 3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන් කරණු ලැබේ.

(අ) වැටුප් සංශෝධනය කිරීමට නියමිත ක්‍රමවේදය අනුගමනය නොකර මණ්ඩලය වැටුප් වැඩි කිරීම සිදුකර ඇත. මණඩලයේ වැටුප සංශෝධනය කිරීමේ අවශ්‍යතාවය මත මූලික වැටුපෙන් සියයට 25 උපරිමයට යටත්ව සංශෝධනය කිරීමට විරුද්ධත්වයක් නොමැති බව දන්වා එවා ඇති 2012 ජූලි 18 දිනැති පීඊඩී 360/12/2 (ii) දරන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ ලිපිය පදනම් කරගෙන වැටුප් වැඩි කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අවසාන මාස 06 සඳහා මණ්ඩලය විසින් රු.1,564,338 ක් වැඩියෙන් ගෙවා තිබුණි.

(ආ) මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ 2009 දෙසැම්බර් 27 දිනැති අංක MF 2/4/IBSL/GEN දරන භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ ලිපිය අනුව කාර්ය සාධනය පදනම් කරගෙන දිරි දීමනා ක්‍රමයක් සකස් කර ඉදිරිපත් කරන ලෙස දක්වා තිබුණත් 2013 ජුනි 30 දින වන විටත් දිරිදීමනා ක්‍රමයක් සකස් කර අනුමැතිය සඳහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) මණ්ඩලය විසින් 2011 වර්ෂයේ ප්‍රසාද දීමනා හා ලබා නොගත් නිවාඩු දින දීමනා වෙනුවෙන් නිලධාරීන් 25 දෙනෙකුට එකතුව රු.2,280,660 ක් ගෙවා තිබුණත්, ඒ සඳහා අදාල උපයන විට ගෙවීම් බදු අයකර දේශිය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කර නොතිබුණි. එසේම, පසුගිය වර්ෂවලදී ද ප්‍රසාද දීමනාව හා නිවාඩු දින දීමනා ගෙවීමේදී උපයන විට ගෙවීම් බදු අඩුකර දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කර නොතිබුණි.

(ඇ) 2011 වර්ෂයේ ඉතිරි කර ගත් අසනීප නිවාඩු සඳහා දීමනා ගෙවීම් කිරීමේදී මණ්ඩලය සකස් කළ පරිපාලන අත්පොතෙහි සඳහන් නියමයන්ට අනුව කටයුතු නොකිරීම නිසා එකතුව රු.259,556 ක් වැඩියෙන් ගෙවා තිබුණි.

(ඉ) 2009 සහ 2010 වර්ෂවල නිවාඩු දින දීමනා ගෙවීම් කිරීමේදී මූලික වැටුප වෙනුවට දළ වැටුප පදනම් කරගෙන ගෙවීම් කිරීම හේතුවෙන් මණ්ඩලය ගෙවා තිබුණු එකතුව රු.580,841 ක

අදාල නිලධාරීන්ගෙන් අයකර ගැනීමට 2013 ජූනි 30 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

(ඊ) 2010 දෙසැම්බර් 09 වන දින පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් දෙන ලද නියෝග අංක 11 අනුව තුන්වන පාර්ශව වන්දි ගෙවීම සඳහා මෝටර් රථ කොමසාරිස්වරයා සමඟ සාකච්ඡා කර විධිමත් වැඩ පිළිවෙලක් සකස් කර එවීමට කටයුතු කරන ලෙස නියෝග කර තිබුණත් මේ පිළිබඳ සමාලෝචිත වර්ෂයේ දී ප්‍රමාණවත් කාර්ය භාරයක් ඉටුකර නොතිබුණි.

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### අයවැය පාලනය

සමාලෝචිත වර්ෂයේ අයවැය ගත වියදම් සහ සත්‍ය වියදම් අතර සියයට 55 සිට සියයට 234 දක්වා විචලනයන් නිරීක්ෂණය වුයෙන් ආයතනය සකස් කළ අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණ.

## 5. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු ආයතනයේ සභාපතිවරයාගේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(i) ගෙවීම්

(ii) පුහුණු වැඩසටහන්